056139
ML/PR
2017/12/11
0083

# සයිබර් සංස්කෘතිය ශ්‍රී ලාංකික සමාජයට බලපාන ආකාරය

(සයිබර් අවන්හල් ආශ්‍රිතව සිදුකරන අධ්‍යයනයක්)

වයි. එස්. අනුෂ්ක රත්නතිලක විජේවීර
ශිෂ්‍ය ලි.ප. අංකය GS/M.Phil./DD/12116

දර්ශනපති උපාධි (M.Phil) පාඨමාලාව

UVPA - Lib. Main
056139
056139

# නිබන්ධන සාරාංශය


සයිබර් සංස්කෘතිය ශ්‍රී ලාංකික සමාජයට බලපාන ආකාරය (සයිබර් අවන්හල් ආශ්‍රිතව සිදුකරන අධ්‍යයනයක්) ලෙස නම් කරන ලද මෙම පශ්චාද් උපාධි පර්යේෂණ නිබන්ධනයෙන් සයිබර් සංස්කෘතිය ශ්‍රී ලාංකික සමාජයට බලපෑමක් ඇතිකරන්නේද යන්නත් එහි භාවිතයන් සහ සමාජ බලපෑම කුමක්ද යන්නත්, කුමන ආකාරයකින් එය සිදුවන්නේ ද යන්නත්, විමසා බැලීම මෙහි මුඛ්‍ය අරමුණු වේ. නාගරික, අර්ධනාගරික හා ග්‍රාමීය ප්‍රජාව නියෝජනය වන ආකාරයෙන් සයිබර් අවන්හල් වර්ගීකරණයට ලක් කර විශ්ලේෂණය කර ඇත. තවද සමස්ථ ශ්‍රී ලාංකික සමාජයම නියෝජනය වන ආකාරයෙන් තෝරාගෙන මෙවැනි පර්යේෂණයක් සිදුකිරීමට නොහැකි බැවින් ඉහත වර්ගීකරණයට විශේෂිතව සිදුකරන ලදී. බස්නාහිර පළාතේ කොළඹ සහ කළුතර දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි නාගරික, අර්ධනාගරික සයිබර් අවන්හල් දෙකක් සහ අර්ධනාගරික හා ග්‍රාමීය නැණසල මධ්‍යස්ථාන දෙකක් ද වශයෙන් සීමාවීමට සිදුවිය.

මෙම පර්යේෂණ නිබන්ධනය පරිච්ඡේද පහකින් සමන්විත වේ. පළමු පරිච්ඡේදයෙන් මෙම පර්යේෂණ නිබන්ධනයේ හැඳින්වීම, අරමුණු, අභිමතාර්ථ, පර්යේෂණ ගැටලුව, මූලාශ්‍ර, පර්යේෂණ ක්‍රමවේදය, අධ්‍යයන සීමා සහ නිබන්ධන සැකැස්ම විස්තර කෙරේ. දෙවන පරිච්ඡේදයෙන් සයිබර් සංස්කෘතිය හා එහි බලපෑම පිළිබඳ පවතින සංකල්පීය හා න්‍යායාත්මක ප්‍රවේශයන් සාකච්ඡා කෙරේ. තෙවන පරිච්ඡේදයෙන් සයිබර් සංස්කෘතිය හා එහි භාවිත ශ්‍රී ලාංකික සමාජයට බලපාන ආකාරය හඳුනාගැනේ. මේ යටතේ සයිබර් සංස්කෘතියේ වර්ධනයට නවීකරණය, කාර්මීකරණය සහ නාගරීකරණය යන සාධකවල බලපෑම, තොරතුරු සන්නිවේදන මාධ්‍යයන්හී වර්ධනය සහ ව්‍යාප්තිය, අන්තර්ජාල පෙළඹවීම්, ඇබ්බැහිවීම් සහ සමාජ ජාල වෙබ් අඩවි සම්බන්ධයෙන් විමසා බැලේ. හතරවන පරිච්ඡේදයෙන් සයිබර් අවන්හල් හා නැණසල මධ්‍යස්ථාන ආශ්‍රිතව අන්තර්ජාලය බහුමාධ්‍ය සන්නිවේදන මාධ්‍යයක් ලෙස භාවිත කිරීමේ ස්වරූපය හඳුනාගැනේ. පර්යේෂිත නාගරික, අර්ධනාගරික හා ග්‍රාමීය නැණසල මධ්‍යස්ථාන ආශ්‍රිත පුද්ගලයන්ගේ අන්තර්ජාල භාවිතය, අවශ්‍යතා, සමාජ ජාල වෙබ් අඩවි සඳහා ඇති නැඹුරුව, ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ මත මෙම පර්චිඡේදය මගින් විශ්ලේෂණය කෙරේ.

මෙම පශ්චාද් උපාධි නිබන්ධනයේ පස්වන පර්ච්ඡේදයෙන් යථෝක්තව සඳහන් කළ සියලුම පරිච්ඡේදයන්හි අන්තරගතය මගින් පැමිණිය හැකි නිගමන සහ යෝජනා ඉදිරිපත් කෙරේ.